## 16. 1994 අංක 04 දරන දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය.

1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ එකතු කරන ලද මුද්දර ගාස්තු දකුණු පළාතේ පළාත් පාලන ආයතනවලට හැරවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

ලුහුඬු නාමය

**01.** මේ ප්‍රඥප්තිය 1994 අංක 04 දරන දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

මුද්දර ගාස්තු හැරවීම

**02.** 1990 අංක 07 දරන දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය සහ 1992 අංක 02 දරන දකුණු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර, පළාත් සභාව විසින් දකුණු පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අයකර, එකතුකර, දකුණු පළාතේ පළාත් සභා අරමුදලට ගෙවා ඇති අවස්ථාවක පළාත් සභාව විසින් ඒ මුද්දර ගාස්තුව අයකර එකතු කරනු ලැබුවේ යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන්ද, ඒ නිශ්චල දේපල පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවක් ඇතුළත ද, ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන නිලධාරියා විසින්, ඉහත කී පරිදි ඒ මුද්දර ගාස්තුව අයකර, එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින සිට අවුරුදු 02ක් වූ කාලසීමාවක් ඇතුළත දකුණු පළාතේ පළාත් අමාත්‍ය මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා වෙත, ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන ලද විට, පළාත් සභාව විසින් ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුවේ මුදල හැරවිය හැකිය

> "මෙම වගන්තියේ කාලසීමාව පිළිබඳව සඳහන් නියමයන්, මෙම ප්‍රඥප්තිය සම්මත වීමට පෙර, වර්ෂයන්ට බල නොපැවැත්විය යුතුය."

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සහතිකය

**03.** 02 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද කිසිම හිමිකමක්, ඒ හිමිකමෙහි සඳහන් කරන ලද මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඔහු වෙනුවෙන් නම් කරන ලද වෙනත් යම් නිලධරයෙකු විසින් සහතික කරන ලද දකුණු පළාත් සභාව විසින් නියම කරන ආකාරයක, උප ලේඛනයක් ඒ හිමිකම සමග ඉදිරිපත් කරනු නොලැබුවහොත්, වලංගු නොවන්නේය.



**04.** මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය කළහොත් මිස "ප්‍රධාන පරිපාලන නිලධාරියා" යන්න -

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි නාගරික කොමසාරිස්වරයා; සහ

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, දැන් එහි ලේකම්වරයා අදහස් වේ.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන බලතලවලට සහ කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා පිහිටුවනු ලබන වෙනත් යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ

"සාධන පත්‍රය" යන්නෙහි 1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ ඇති අර්ථයම ඇත්තේය;

"පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට, සිංහල පාඨය බල පැවැත්විය යුතු බව

**05.** මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විටක, සිංහල භාෂා පාඨය බල පවත්නේය